**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩුව**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී උපමානපාදක සංවර්ධන ප්‍රදාන වැඩ සටහන යටතේ මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණු කර්මාන්ත 02 ක් සහ ද්‍රව්‍යාධාර ලබාදීම් 15 ක් වෙනුවෙන් රු. 2,027,364 ක ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර ඉහත කර්මාන්ත 02 ට අදාලව රු. 1,766,578 ක ණයහිමි ප්‍රතිපාදනද සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 24,861 ක පුනරාවර්තන වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 117,000 ක් සහ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා පුස්තකාලයාධිපති තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් ඌව පළාත් සභාවෙන් ලැබිය | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| | යුතු රු.12,313 ක් ගිණුම්ගතකර නොතිබුණි. | | |
| (iv) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද කර්මාන්ත 2ක් සඳහා රු. 40,711 ක් ණයගැති සහ ණයහිමි ප්‍රතිපාදන වැඩියෙන් සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (v) | සභාවට අයත් ඉඩම් කැබැලි 65 ක් තක්සේරුකර ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (vi) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු. 430,990 ක ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ආදායම ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (vii) | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.57,000 ක් සහ රු. 27,000 ක් වූ සම්ප්‍රේෂණ කුළුණු සඳහා ලැබිය යුතු ව්‍යාපාර බදු ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 05 දින පරිත්‍යාග ලෙසට ලැබී තිබුණු නළ ළිං අලුත්වැඩියා කිරීමේ කට්ටලයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |
| (ix) | හඳුනා නොගත් ආදායම් සහ විවිධ පාර්ශවයන්ට ගෙවිය යුතු රු. 398,173 ක් හඳුනාගෙන අදාල ගිණුම් යටතේ ගිණුම්ගත නොකර පොදු තැන්පත් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් විෂයයන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ගැලපීම්කර නිවැරදි කරමි. |

**(ආ)** <u>**අසම්භාව්‍ය බැරකම්**</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 4 ක් විසින් නඩු 6 ක් පවරා තිබුණු අතර ඒ පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරියේදී සටහනක් ලෙස හෙළිදරව් කරමි. |

**(ඇ)** **නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු ලෙජරය අනුව කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ රු. 545,572 ක බැර ශේෂයක් වුවද කර්මාන්ත අත්තිකාරම් ලේඛනය අනුව එය රු.10,914 ක් වූයෙන් රු. 534,658 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | රු. 10,914 ක මුදල මාර්ගයක කුට්ටිගල් ඇතිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට ගෙවීම් කළද එය නුසුදුසු වූ බැවින් කර්මාන්තය ක්‍රියාත්මක නොකළ අතර රු. 534,658 කුට්ටිගල් මිලදී ගැනීමට ගෙවීම් කළ යුතු මුදලකි. සැපයුම්කරුවන් පිළිබඳව නිවැරදි තොරතුරු නොමැති බැවින් ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. |

**(ඈ)** **විගණනය සඳහා සාක්ෂි නොවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.184,980,401 ක වත්කම් විෂයයන් 3 ක් සහ රු. 36,710 ක වගකීම් විෂයයකට අදාලව ස්ථාවර වත්කම් ලේඛනය, ආදායම් ලේඛන, උපලේඛන හා කේවල ශේෂ ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට සහ කේවල ශේෂ විස්තර ලබා ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. |

**1.4** **අනුකූල නොවීම**
**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** 140 වගන්තිය | වරිපනම් බදු අයකිරීම සඳහා දේපල කාලීනව තක්සේරු නොකර 2012 වර්ෂයේ තක්සේරුවක් මත සමාලෝචිත | පනත ප්‍රකාරව තක්සේරු කළ | 2019 වර්ෂයේදී තක්සේරු කිරීම් සඳහා කටයුතු කරමින් |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී වරිපනම් බදු අයකර තිබුණි. | යුතුවේ. | පවතී. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ගිණුම්වල දැක්වෙන සභාවේ සේවය කළ සේවකයින් 56 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 132,598 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම සේවකයින් දැනට සේවයේ නොමැති අතර විගණන හා කළමනාකරණ කමිටුවට යොමුකර විෂයභාර අමාත්‍යවරයා හරහා ශේෂ කපා හැරීමට කටයුතු කරමි. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2015 සහ 2016 වර්ෂවලදී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 46 කට අදාල ඉදිකිරීම් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව ඉදිකිරීම් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත් කළ යුතුවේ. | සහතික ලබා ගන්නා ලෙස ලිඛිතව දැනුවත් කොට ඇති අතර කොටසක් දැනටමත් නිකුත් කර ඇත. ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර අනෙකුත් සහතික නිකුත් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,066,419 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,984,246 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,055,383 | 6,046,520 | 2,234,194 | 3,812,326 | 6,100,000 | 6,052,614 | 2,508,700 | 3,543,914 |
| (ii) | කුලී | 15,600,000 | 10,443,422 | 7,066,285 | 3,377,137 | 14,620,000 | 10,686,712 | 8,687,680 | 1,999,032 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,150,000 | 1,011,150 | 1,011,150 | - | 900,000 | 1,247,527 | 1,247,527 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,759,150 | 1,665,345 | 1,665,345 | - | 1,500,000 | 812,486 | 812,486 | - |
| | එකතුව | 24,564,533 | 19,166,437 | 11,976,974 | 7,189,463 | 23,120,000 | 18,799,339 | 13,256,393 | 5,542,946 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 19,166,437 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 7,189,463 ක් හෙවත් සියයට 37 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | ආදායම් පරීක්ෂකවරුන්ගේ ගැටළුකාරී තත්ත්වය සහ පරිපාලන වෙනස්වීම් මත ආදායම් රැස්කිරීම අඩු වූ අතර කණ්ඩායම් වශයෙන් නිලධාරීන් යොදවා ආදායම් රැස්කරමින් පවතී. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1986 වර්ෂයෙන් පසු දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර වරිපනම් බදු මුදල් අයකර ගත යුතුවේ. | ආදායම් පරීක්ෂකවරයෙකු නොමැති වූ බැවින් ආදායම් අංශ වැඩ කටයුතු අතපසු වූ අතර ඉදිරියේදී වරිපනම් බලප්‍රදේශය පුළුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වරිපනම් බදුවලින් නිදහස් කළයුතු පොදු ආගමික පුන්‍යකර්ම අධ්‍යාපනික හා ගෘහ දේපළ පිළිබඳ ලැයිස්තුවක් සකස්කර පවත්වාගෙන නොතිබුණි. | වරිපනම් නිදහස් ලේඛනයක් සකස් කළ යුතුවේ. | ලේඛනයක් සකස් කරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභා වරිපනම් බලප්‍රදේශයේ සැලසුම් කමිටු අනුමැතිය ලබා ඉදිකරනු ලබන ගොඩනැගිලි සඳහා වාර්ෂික වටිනාකම තක්සේරුකර වරිපනම් බදු අය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | වාර්ෂික වටිනාකම් තක්සේරුකර වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් ඒකක හඳුනා ගැනීමටත් ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා වරිපනම් තක්සේරු කර අයකිරීමට කමිටුවක් පත්කර ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 8,934,365 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 7,094,802 ක් හෙවත් සියයට 79 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | ආදායම් පරීක්ෂක රාජකාරී ඉටු කිරීමට සුදුසු නිලධාරීන් නොමැතිවීමත් වරිපනම් තක්සේරුව සඳහා බදුකරුවන්ගේ සහ වෙළඳ සංගමයේ විරෝධතාව හේතුවෙන් වරිපනම් අයකිරීමේ ප්‍රගතිය අඩු වී ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 6,046,520 ක් වූ වරිපනම් බදු ආදායමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,812,325 ක් හෙවත් සියයට 63 ක් අයකර නොතිබුණි. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | 2018 හිඟ සහ ඊට පෙර හිඟ අයකර ගැනීමට විශේෂ කණ්ඩායමක් බලප්‍රදේශය කොටස් 4 කට බෙදා වගකීම් පවරා ඇත. |

### 2.2.4 දේපළ බදු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් දේපළ 13 ක් බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයන් සඳහා අයවිය යුතු රු. 4,893,748 ක ශේෂයක් විය. | හිඟ බදු මුදල් අයකරගත යුතුවේ. | දැනට වසර ගණනාවකට පෙර හිඟ අයකර ගැනීමට එවකට සිටි නිලධාරීන් කටයුතුකර නොතිබුණද සමාලෝචිත වර්ෂයට ආසන්න වර්ෂවල සියළු බදු මුදල් අයකිරීමට ලිපි නිකුත්කර ඇති අතර ඉදිරියේදී නීතිමය කටයුතු මගින් අයකර ගනිමි. |

### 2.2.5 කඩකාමර කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් බදුදී ඇති කඩකාමර 94 කින් 2018 දෙසැම්බර් 31 දිනට රු. | හිඟ කුලී අයකරගත | බස් නැවතුම්පොළ සහ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කිහිපයක් බදුදීමට |

| | | |
|---|---|---|
| 3,796,240 ක කුලී අයකරගෙන නොතිබුණි. | යුතුවේ. | නොහැකිව වසා දමා ඇති අතර කඩකුලී තක්සේරුවට කඩහිමියන් විරෝධය පළ කළ බැවින් කුලී ගෙවීමේ ප්‍රගතිය අඩු වී ඇත. ආදායම් පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු නිසා හිඟ අය කිරීම් අවම වී ඇති අතර බදු නොදුන් කඩකාමර බදු දීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.6 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර ඇති ආයතන 03 කට අයත් සම්ප්‍රේෂණ කුළුණු 19 කින් ඉකුත් වර්ෂය සඳහා රු. 57,000 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා රු. 27,000 ක් ලෙසට අයවිය යුතු රු.84,000 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට ආයතනවලට ලිපි යවා ඇති අතර ඉදිරියේදී මුදල් අයකර ගනිමි. |

### 2.2.7 ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ආයතන 8ක් විසින් ස්ථාපිත කර තිබුණු පුවරු 10 ක් වෙනුවෙන් ඉකුත් වර්ෂය සඳහා අයවිය යුතු රු. 430,990 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකරගත යුතුවේ. | හිඟ අයකර ගැනීමට ආදායම් පරීක්ෂක වාර්තා නොලැබුණු අතර දැනට නගරයේ සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබාදී ඇත. |

### 2.2.8 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් යන්ත්‍ර කුලියටදීම වෙනුවෙන් ඉකුත් වර්ෂ සඳහා රු. 614,820 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා රු.73,500 ක් ලෙසට අයවිය යුතු රු. 686,320 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී අයකරගත යුතුවේ. | 2018 වර්ෂයේ හිඟ මුදලින් රු. 59,500 ක් අයවී ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමි. පෙර වර්ෂවල හිඟ අයකර ගැනීමට ලිපිගොනු පරීක්ෂා කරමින් පවතින අතර ඉදිරියේදී තොරතුරු දන්වා එවමි. |

**2.2.9** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු.2,637,154 ක් හා මුද්දර ගාස්තු රු.4,877,459 ක් විය. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ අයකර ගැනීමට අවශ්‍ය උපලේඛන සකසමින් පවතින බැවින් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. 2018 වර්ෂයට අදාල මුද්දර ගාස්තු උපලේඛන සකස්කර ඉදිරිපත් කරමි. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් ඉන් කාරණා 7 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ඉතිරි කාරණා 7 වැළඳ ගැනීමට ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කරමින් පවතී. |

**(ආ)** ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා රාජකාරී පැවරීමට කටයුතු කර ඇත. |

**(ඇ)** **<u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ---------------------------------------- |
| (i) | ප්‍රාදේශීය සභාව විසින් කසළ බැහැරකරන ආනපල්ලම ඉඩම ප්‍රාදේශීය සභාවට අත්කර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණු අතර දිරන කසළ භාවිතා කරමින් කාබනික පොහොර නිපදවීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | ඉඩම් අත්පත්කර ගෙන කාබනික පොහොර නිපදවීමට කටයුතු කළ යුතුවේ. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩමෙන් කොටසක් ලබාදීමට එකඟවී ඇති බැවින් කසළ අංගනය ඉදිකිරීමට පෙර වන අලින්ගෙන් ආරක්ෂාවීමට විදුලි වැටක් හා ඉඩම වටා කාණුවක් ඉදිකිරීමට අපේක්ෂා කරමි. |
| (ii) | දෛනිකව රැස්කරනු ලබන වාණිජ වටිනාකමක් සහිත ඝන අපද්‍රව්‍ය ලේඛනගත කිරීමට, ගබඩා කිරීමට සහ අලෙවි කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | වාණිජ වටිනාකමක් සහිත ඝන අපද්‍රව්‍ය ලේඛනගත කිරීමටත් අලෙවි කිරීමටත් විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ. | කසල අංගනය ඉදිකිරීමෙන් පසු කසල වෙන්කර ලබා ගැනීමටත් ඉන් අනතුරුව ලේඛනගත කිරීමටත් කටයුතු කරමි. |

**(ඈ)** **<u>තිරසර සංවර්ධනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ---------------------------------------- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | නිලධාරීන් කිහිපදෙනෙකු දැනුවත්වී තිබුණද ඒ පිළිබඳ මනා අවබෝධයක් නොමැතිකමින් ඉලක්ක හා අරමුණු හඳුනා ගැනීමට නොහැකිවී ඇත. |

**3.2** **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------------------------- |
| (අ) | ජේ.එම්. කුමාරදාස අනුස්මරණ සම්මන්ත්‍රණශාලාව වර්ෂ 03ක් පමණ කාලයක් ප්‍රයෝජනයට නොගෙන පැවතීමත් නඩත්තු කටයුතු සිදු නොකිරීමත් නිසා අබලන් තත්ත්වයක පැවතුණි. | නඩත්තු කටයුතු කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගත යුතුවේ. | ගිවිසුම්කරු පෞද්ගලිකව මුණ ගැසී ඔහුගේ භාණ්ඩ ඉවත්කර ගන්නා ලෙස දන්වා, එසේ කටයුතු නොකරයි නම් නීතිපති විමසා ඉදිරි කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර 12ක් හා බස් නැවතුම්පල උඩුමහල කඩකාමර 03ක් බදුදීමට කටයුතුකර නොතිබුණි. | කඩ කාමර බදුදීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර බදුදීම සඳහා අවශ්‍ය පියවර පළාත්පාලන කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව මගින් 2016 ඉදිකර තිබුණු මහවෙලමුල්ල නිවාස සංකීර්ණයේ ඉඩම පවරාගෙන නොතිබුණු අතර නිවාස සංකීර්ණයේ වැඩ අවසන්කොට කම්කරුවන්ට ලබාදීමටද කටයුතුකර නොතිබුණි. | ඉඩම පවරාගෙන නිවාස සංකීර්ණයේ වැඩ අවසන් කර කම්කරුවන්ට ලබාදීමට කටයුතු කළ යුතුවේ. | අදාල ඉඩම පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. |
| (ඈ) | ක්ෂේත්‍ර සහ සෞඛ්‍ය කම්කරුවන් 22 දෙනෙකු අදාල තනතුරුවල රාජකාරිවලින් බැහැර රාජකාරිවල යොදවා තිබුණි. | තනතුරුවලට අදාල රාජකාරිවල යෙදවිය යුතුවේ. | පෙර පාසල්, පුස්තකාල, ආදාහනාගාර, සම්මන්ත්‍රණශාලා සහ පොදු වැසිකිළි සහ අනුබද්ධ ආයතනවල මුර සේවය සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති බැවින් ද ආදායම් පරීක්ෂකවරුන් දෙදෙනෙකු නොමැති බැවින්ද ආදායම් රැස් කිරීමට යොදවා ඇත. |
| (ඉ) | ධාවනයෙන් ඉවත්කරන ලද වාහන 03ක් අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | අපහරණය කළ යුතු වාහන අපහරණයට කටයුතු කළ යුතුවේ. | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ විසින් අපහරණය කළ යුතු වාහන 3 ක් සම්බන්ධයෙන් තොරතුරු ලබාගත් අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරමි. |
| (ඊ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් පත්‍රයේ කසළශෝධන අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන කසළ ඉවත්කිරීම සඳහා බදු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. | කසළ බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | විධිමත් පරිදි කසළ අංගනය ඉදිකළ පසු කසළ බදු අයකරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභා බලප්‍රදේශය තුළ විවිධ ආයතන සහ පුද්ගලයින් විසින් ප්‍රදර්ශනයකර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් කර නොතිබුණි. | ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 126 ක් සහ වලංගු කාලය ඉකුත්වී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 28ක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණු බැවින් රු. 616,000 ක ආදායමක් අහිමිවී තිබුණි. | පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හඳුනාගෙන බලපත්‍ර නිකුත් කළ යුතුවේ. | මේ පිළිබඳව සමීක්ෂණ සිදුකරන ලෙස විෂය නිලධාරීට උපදෙස් ලබාදුන් අතර එය අවසන් වූ වහාම බලපත්‍ර ලබාදීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභා බලප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු ගෙවිය යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදුකළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකර ඇත. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **කාර්ය මණ්ඩල තොරතුරු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සභාවේ තනතුරු 05 කට අදාලව සේවකයන් 40 දෙනෙකුගේ අතිරික්තයක් සහ සේවක පුරප්පාඩු 03 ක් පැවතුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගැනීමටත් පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමටත්කටයුතු කළ යුතුවේ. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් අභ්‍යන්තර තුලනය මගින් සංවර්ධන නිලධාරීන් 8 දෙනෙකු අනුමතකර ඇති අතර ඉතිරි 9 දෙනා රා.ප.ච. 25/2014 මගින් ස්ථිර කර ඇත. ඉතිරි 23 දෙනා අනියම්, ආදේශක, කොන්ත්‍රාත් අයවේ. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

**3.4.1 <u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර හඳුනාගෙන තිබුණු ඉඩම් 76 ක මැනුම් කටයුතු සිදුකර භූමි ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතුකර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් මැනීම් කටයුතු කර ඉඩම් වෙන්කරගත යුතුවේ. | 2019 වර්ෂයේ නිරවුල් ලෙස හඳුනාගත් ඉඩම් මැනීමට කටයුතු කරමි. |

## 3.4.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 09ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කල යුතුවේ. | ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කිරීමට අවස්ථා කිපයකදී උත්සාහ දරා ඇතත් සිදු කිරීමට නොහැකි වූ බැවින් ඩිපෝ ඉංජිනේරු වෙත ලිඛිතව දන්වා ඇත. |

## 3.5 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ අයවැය සකස් කර ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 4 ක සියයට 12 සිට සියයට 48 දක්වාද වියදම් විෂයයන් 8ක සියයට 13 සිට සියයට 96 දක්වාද විචලනයන් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි සභාවේ යන්ත්‍ර සූත්‍ර යොදවා කර්මාන්ත ඉටු කිරීම නිසා යන්ත්‍ර සූත්‍ර වලින් අපේක්ෂිත ආදායම් නොලැබුණු අතර ආදාහනාගාර ආදායම්ද අපේක්ෂිත මට්ටමට නොලැබුණු අතර, නිරවුල් කර නොතිබුණු දායක විශ්‍රාම වැටුප් නිරවුල් කළ බැවින් මෙම විචලනයන් සිදු වී ඇත. |

**4.2** <u>අභ්‍යන්තර විගණනය</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇතත් පූර්ණකාලීනව එම කටයුතු සිදු කිරීමට නොහැකිවී ඇති බැවින් 2019 වර්ෂයේදී නිසි පරිදි සිදුකරන බව දන්වමි. |

**4.3** <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 9 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාවල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටු විය යුතුවේ. | කමිටුවක් වෙනම නොතිබුණද මොනරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය සභා එක්ව කාර්තුවකට එක් කමිටුවක් බැගින් පැවැත්වූ බව දක්වා ඇත. |